## තාලම් නැටුමේ සුවිශේෂ ලක්ෂණ හා නර්තන නිර්මාණය

තාලම්පට දෑතට ගෙන වාදනය කරමින් නර්තනයේ යෙදීම තාලම් නැටුමේ විශේෂ ලක්ෂණය යි. ගායනයේ දී හා නර්තනයේ දී තාල තැබීමට යොදා ගන්නා තාලම්පට තාලම් නැටුමේ දී රංග භාණ්ඩයක් ලෙස යොදා ගනියි. එමෙන් ම බොහෝ ගැමි නැටුම් ජීවන වෘත්තියකට සම්බන්ධ වුව ද තාලම් නැටුම එසේ නොවේ. එය විනෝදාස්වාදය සඳහා ම නිර්මාණය වූවකි. තාලම් කවි නිර්මාණය වී ඇත්තේ සරල භාෂාවෙන් වන අතර, ඇතැම් ඒවා ප්‍රතිවාදීන්ට අභියෝගාත්මක ස්වරූපයෙන් ද රචනා වී ඇත.

එනවා ඇදුරෝ තරගෙට කීම කියාගෙන
දනවා හදවත තාලම උපත ඇසූ තැන
මොනවා වත් දන්නේ නැති ව සබයට ආ තැන
දෙනවා මගෙ තාලම්පට උපත කියාදෙන

තාලම් නැටුම පිරිමි කාන්තා දෙපක්ෂය විසින් ම රඟ දක්වනු දැකිය හැකි ය. පිරිමි පක්ෂය විසින් රඟ දක්වන විට තාණ්ඩව බවක් දක්නට ලැබේ. තාලම්පට දෑතට ගෙන විවිධ ක්‍රම ශිල්ප උපයෝගී කර ගනිමින් හරඹ දැක්වීම මෙහි සුවිශේෂ ලක්ෂණයකි.

තාලම් කවි විවිධ තාල රූප අනුව ගායනය කරමින් නර්තනය කළ හැකි ය.

**මාත්‍රා 3 තාලය**

අගේ වඩන මගෙ තාලම් හරඹ බලන්නේ
වගේ නො දැන ඇයි නුඹලා කීමට එන්නේ
කගේ ගිල්ල ලෙස බැරිවෙයි නුඹට බොලන්නේ
මගේ දෑත තාලම්පට හරඹ බලන්නේ

**මාත්‍රා 4 තනි තිත**

සඳවට තරුවැල් ඇවිදින් කල එළි සද්දේ
මඳකොට පවසමි ඇවිදින් ඇරඹුණ යුද්දේ
යුදයට වසවතු ඇවිදින් පැරදුණ යුද්දේ
බඳවට කැරකෙන මගේ තාලම්පට සද්දේ

අහසේ තාලම් තාංගු තාලම් - සඳවට කැරකී යයි තාලම්
පොළොවේ තාලම් තාංගු තාලම් - වැලියට සැඟවී යයි තාලම්
මුහුදේ තාලම් තාංගු තාලම් - රැළි යට සැඟවී යයි තාලම්
අපගේ තාලම් තාංගු තාලම් - බඳවට කැරකී යයි තාලම්

තාලම් නැටුම සඳහා සරල පද යොදා ගනිමින් ගායනය හා වාදනය සහිත ව සාමූහික ව නර්තනයේ යෙදේ.

**ක්‍රියාකාරකම :**

- විවිධ තාල රූපවලට තාලම් කවි ගායනය කරන්න.
- තාලම් නැටුමකට සුදුසු පද හතරක් නිර්මාණය කරන්න.
- රංග රටා හා සම්බන්ධතා ඇසුරු කොට ගෙන සාමූහික ව තාලම් නර්තනයක් ඉදිරිපත් කරන්න.

**කුලු නැටුම් හා සබැඳි සුවිශේෂ ලක්ෂණ හා නර්තන නිර්මාණය**

කෘෂිකාර්මික ජන සමාජයේ අත්‍යවශ්‍ය උපකරණයක් ලෙස භාවිත වන කුල්ල ඇසුරු කර ගනිමින් නිර්මාණය කොට ඇති අලංකාර ගැමි නැටුමක් ලෙස කුලු නැටුම හඳුන්වා දිය හැකි ය.

කුල්ල කමතේ දී භාවිත කරනු ලබන අතර මුළුතැන් ගෙයි උපකරණයක් ලෙස නිවසේ දී භාවිත කරයි. කමතේ දී බැත එකතු කිරීම, කාටුව පිස හැරීම, බැත හුළං කිරීම, ගල්වැලි සහලින් ඉවත් කිරීම සඳහා පූ කිරීම, පිරිසිදු කළ බැත ගෝනිවලට පිරවීම ආදි කාර්යයන්හි දී කුල්ල යොදා ගැනේ. කමතේ දී පිරිමි පාර්ශ්වය කුල්ල භාවිත කරන අතර මුළුතැන්ගෙයි වැඩකටයුතුවල දී එනම් වී පෙළීම, සහල් පෙළීම, සහල් පූ කිරීම ආදි කටයුතුවල දී කාන්තාවන් විසින් කුල්ල භාවිත කරනු ලැබේ.

කුලු නැටුම සඳහා යොදා ගන්නා කවි විවිධ තාල රූප හා විවිධ නාදමාලා අනුව සරල ගැමි බස් වහරකින් නිර්මාණය වී ඇත. එමෙන් ම මේ සඳහා රත්නමාලී දෙව්දුව සම්බන්ධ රන්තෙලඹු වර්ණනාවේ එන කවි හා රත්නවල්ලී කවි ද යොදා ගනු ලැබේ.

රටා දමා කුල්ල සකස් කිරීම කොතරම් අපහසු කාර්යයක් දැයි එහි එන සමහර ගායනාවලින් පැහැදිලි වේ.

කැලේ ගොසින් බට පතුරු      කපන්නේ<br>
පළා පුරුක් හැර අව්වේ      දමන්නේ<br>
නමා දෙකොන මුළු අස්සේ      පුරන්නේ<br>
රටා දමාලයි කුල්ල      වියන්නේ

එසේ සකසා ගත් කුල්ල නර්තනයේ දී විවිධ සැරසිලි හා වර්ණ යොදා අලංකාර කර ගනියි.

කෘෂි කර්මාන්තයේ දී කුල්ල භාවිතයට ගන්නා අවස්ථා ඉහතින් දක්වා ඇත. එම අවස්ථා පදනම් කර ගනිමින් කුලු නැටුම නිර්මාණය වී ඇත. විශේෂයෙන් කාන්තාවන් සඳහා වඩාත් යෝග්‍ය ගැමි නැටුමක් ලෙස කුලු නැටුම හැඳින්විය හැකි ය. ඉතා සරල වුත්, අලංකාර වූත් සරල මාත්‍රා (පද) යොදා ගනිමින් නර්තනයේ යෙදිය හැකි සාමූහික නර්තන අංගයකි.

අවකාශ භාවිතය සැලකිල්ලට ගෙන විවිධ රංග රටා ගොඩ නඟමින් කුල්ලෙන් කරනු ලබන කාර්යයන් අනුකරණාත්මක ව නර්තනය සඳහා යොදා ගත හැකි ය.

වර්තමානයේ ප්‍රසංග වේදිකාව සඳහා කුලු නැටුම නිර්මාණය කිරීමේ දී සංකීර්ණ තාල රටා, මාත්‍රා (පද) හා රංග රටා යොදා ගනිමින් නර්තනය කරන අයුරු දක්නට ලැබේ.





ඉහත පින්තූර නිරීක්ෂණය කිරීමේ දී කුල්ල භාවිත කරමින් නර්තනය සිදු කරන අයුරු පෙනේ.

- කුලු රැගෙන සබයට එන කාන්තාවෝ
- කුල්ලෙන් වී හුළං කිරීම
- කුල්ලට වී පිරවීම
- අතින් අත මාරු කර යැවීම
- වී පෙළීම, පූ කිරීම
- පොළන ලද වී පසකට දැමීම
- කාර්ය නිමා කිරීමේ දී ලද සතුට ආදි අවස්ථාවන් කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

කුලු නැටුම නිර්මාණයේ දී පහත සඳහන් කුලු කවි ගායනය සඳහා භාවිතයට ගත හැකි ය.

**මාත්‍රා 3 තාලය**

1. ඈත සිටන් එන්නී සෙල්ලි සෙල්ලියේ
   මෑත සිටන් එන්නී සෙල්ලි සෙල්ලියේ
   අතේ පයේ ගිගිරි ද සෙල්ලි සෙල්ලියේ
   කුලු සරඹෙට එනව ද රත්න වල්ලියේ

2. බන්දවාන කුලු යතුරු තනාලා
   ඈන්දවාන අළු යන්තරේ ඇඳලා
   කැන්දවාන දෙදෙනෙකුට කියාලා
   කන්ද බැඳෙන බැත පැහැපත් කරලා

| | | |
|---|---|---|
| 3. | ළමා ලියෝ ගවසා මල් වරල | පිට |
| | දමා කරට මුතුපොට අත වළලු | වට |
| | පෙමා වඩන ලෙස සරසා ඔසරි | පොට |
| | පමා නොව රඟත් කුලු ගෙන සබේ | පිට |

**ක්‍රියාකාරකම :**

1. විවිධ තාලරූප අනුව කුලු කවි ගායනය කරන්න.
2. කුල්ල භාවිත කරමින් කුලු නැටුමට සුදුසු පද හතරක් නිර්මාණය කරන්න.
3. විවිධ රංග රටා භාවිත කරමින් කුලු නැටුමක් නිර්මාණය කරන්න.
4. අවකාශය නිසි ලෙස භාවිත කරමින් සාමූහික ව කුලු නැටුමක් ඉදිරිපත් කරන්න.